IOM UN MIGRATION | PRESS NOTE

# <u>ශ්‍රී ලංකාව තුල මිනිස් වෙළඳාම පිටු දැකීම සඳහා "IMPACT" ව්‍යාපෘතිය එළිදැක්වීම</u>

**කොළඹ** - එක්සත් ජාතීන්ගේ සංක්‍රමණ ආයතනය වන සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM), එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ මිනිස් වෙළඳාම නිරීක්ෂණය කිරීමට සහ එරෙහිව සටන් කිරීමට පිහිටුවා ඇති කාර්යාලයේ අරමුදල් සහාය ඇතිව, මිනිස් වෙළඳාම පිටු දැකීම සඳහා තුන් අවුරුදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ඇත. 2022 ජූලි 29 වන දින කොළඹ පැවති උත්සවයකදී "මිනිස් වෙළඳාම පිටු දැකීම සඳහා සහ වැඩි බලපෑමක් ඇති කිරීම සඳහා ඉවහල් වන අයුරින් රාජ්‍ය සහ සිවිල් සමාජ සංවිධානයන්හි හැකියාව වර්ධනය කිරීම" යන මෙම ව්‍යාපෘතිය "IMPACT" නිල වශයෙන් දියත් කරන ලදි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මිනිස් වෙළඳාමට (Trafficking in Persons) එරෙහිව ඵලදායි ලෙස සටන් කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම කෙරෙහි ජාතික සහ ප්‍රාදේශීය/ප්‍රජා මට්ටමේ හැකියාවන් ශක්තිමත් කිරීම සහ ප්‍රජා මෙහෙයවීම ඉහළ නැංවීම හා මිනිස් වෙළඳාම නිරීක්ෂණය කිරීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම සඳහා ජාතික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (National Strategic Action plan to Monitor and combat Human Traffciking 2021-2025) ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දායක වීමයි. "IMPACT˜ ව්‍යාපෘතිය ආරක්ෂක අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන මිනිස් වෙළඳාමට එරෙහි ජාතික සංධානය (National Anti-Human Trafficking Task Force) සමඟ සමීප සහයෝගයෙන් ක්‍රියාත්මක කෙරේ.

මිනිස් වෙළඳාම යනු රට තුළ සහ දේශසීමා හරහා සිදුවන සංවිධානාත්මක අපරාධයකි. එය පිරිමින්ට, කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහිව බලපෑම් ඇති කරන වරදක් වන අතර ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි. මිනිස් වෙළඳාම විවිධ ස්වාභාවයන්ගෙන් යුක්ත විය හැකි අතර බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම සහ ලිංගික සූරාකෑම මෙයට ඇතුලත් වේ. මෙකී අපරාධයට එරෙහිව සටන් කිරීම සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවකරුවන්ගේ මනා සම්බන්ධීකරණයකින් යුක්ත වූ ප්‍රතිචාරයක් අවශ්‍ය වේ.

සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ ශ්‍රී ලංකාවේ කාර්යාලයට, මිනිස් වෙළඳාමට එරෙහි ජාතික සංධානය සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීමේ හා මිනිස් වෙළඳාම පිටු දැකීම සඳහා පුළුල් අත්දැකීම් සහ දිගු ඉතිහාසයක් ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ, සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින් රට පුරා දිස්ත්‍රික්ක 11 ක මිනිස් වෙළඳාමට එරෙහි ප්‍රයත්නයන් ක්‍රියාත්මක කිරීම සඳහා සේව් ද චිල්ඩ්‍රන් (save the children) සහ වෙනත් සිවිල් සමාජ සංවිධාන හතරක් සමඟ හවුල් වනු ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් , රාජ්‍ය නිලධාරීන් සහ රාජ්‍ය නොවන පාර්ශවකරුවන් පුහුණු කිරීම, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් වෙත ළඟා වීමේ ක්‍රියාකාරකම් දියත් කිරීම, මිනිස් වෙළඳාමේ වින්දිතයින්ට සහාය ලබා දීම, රැකවරණ මධ්‍යස්ථාන සහ විමර්ශන දියත් කිරීමේ ආයතන වැඩි දියුණු කිරීමට සහාය දීම, ළමුන් වෙළඳාම මැඩලීම සඳහා මැදිහත්වීම්, මිනිස් වෙළඳාමට එරෙහි ජාතික සංධානය වෙත තාක්ෂණික සහාය ලබා දීම, ජාතික යොමු කිරීමේ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම, මිනිස් වෙළඳාම පිළිබඳ සදාචාරාත්මක සහ සත්‍ය පදනම් කරගත් වාර්තාකරණය පිළිබඳව මාධ්‍යවේදීන්' පුහුණු කිරීම සහ පුද්ගලික අංශයේ සංචාරක සේවා සපයන්නන් සමඟ මිනිස් වෙළඳාම වැළැක්වීම සඳහා සහයෝගීතාවයෙන් කටයුතු කිරීම ඇතුළු පුළුල් ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල අරමුණ වන්නේ මිනිස් වෙළඳාම පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම, වින්දිතයන් හඳුනා ගැනීම,ආරක්ෂක සේවා සැපයීම වැඩිදියුණු කිරීම සහ ග්‍රාමීය මට්ටමේ සිට මධ්‍යම රජයේ මට්ටම දක්වා වාර්තා කිරීමේ සහ යොමු කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමයි.

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිනිය අතිගරු ජූලී චන්ග් මැතිණිය ප්‍රකාශ කළේ"- මෙම නව ව්‍යාපෘතියේ ආරම්භය සනිටුහන් කරන අවස්ථාවේ, එය 2022 තැනැත්තන් වෙළඳාම වාර්තාවේ ප්‍රධාන නිර්දේශ කිහිපයක් ක්‍රියාත්මක කිරීමට සහාය වනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු. වින්දිතයින් හඳුනා ගැනීම, වින්දිතයන්ට ලබා

INTERNATIONAL ORGANIZATION FOR MIGRATION (IOM)
9th Floor, Institute of Bankers of Sri Lanka Building • No. 80A, Elvitigala Mawatha • Colombo 08, Sri Lanka
Phone: +94 11 5325 300 / +94 11 2112 600
Fax: +94 11 5325 302 / +94 11 2112 602
Email: iomcolombo@iom.int Website: www.srilanka.iom.int

දෙන සේවාවන් වැඩිදියුණු කිරීම, සංචාරක ක්ෂේත්‍රයේ පවතින ළමා ලිංගික වෙළඳාම මැඩපැවැත්වීමේ උත්සාහයන් වැඩිදියුණු කිරීම, සුරක්ෂිත සහ විධිමත් සංක්‍රමණය ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර රාජ්‍ය සම්බන්ධීකරණය සඳහා අඛණ්ඩ ආයතනිකකරණයට සහාය වීම ඒ අතර වේ.'˜

සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයෙහි සහය පෙරදැරිව, සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ ශ්‍රී ලංකා සහ මාලදිවයිනේ දූත මණ්ඩල ප්‍රධානී සරත් දාෂ් මහතා, ශ්‍රී ලංකා රජයට මිනිස් වෙළඳාමට එරෙහි ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම සඳහා පූර්ණ සහාය දෙන බව ප්‍රකාශකළේය. අපරාධයේ සංකීර්ණත්වය, වින්දිතයන් හඳුනාගැනීමේ දුෂ්කරතා, අපරාධකරුවන්ට නඩු පැවරීමේ අභියෝග සහ අපරාධයේ නිරන්තරයෙන් වෙනස් වන ස්වභාවය හේතුවෙන් රජය, සිවිල් සමාජය, පෞද්ගලික අංශය සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගෙන් වඩාත් සාමූහික සහ පුළුල් ප්‍රතිචාරයක් අවශ්‍ය බව ඔහු ප්‍රකාශ කර සිටියේය ˜IMPACT˜ ව්‍යාපෘතිය මගින් උත්ප්‍රේරණය කරන ලද හවුල්කාරිත්වයන් මගින් මිනිස් වෙළඳාමට එරෙහි ප්‍රතිචාර ඵලදායි ලෙස ලබාදීම, මිනිස් වෙළඳාම වැලැක්වීම, වින්දිතයින් ආරක්ෂා කිරීම සහ අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරීම යනාදිය ශක්තිමත් කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය දියත් කිරීමේ උත්සවය සාර්ථකව පැවැත්වුණු අතර, ජාතික බුද්ධි ප්‍රධානී - මේජර් ජෙනරාල් ජේ.ආර් කුලතුංග, ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිනි ජුලී චන්ග්, සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයෙහි ශ්‍රී ලංකා සහ මාලදිවයිනේ දූත මණ්ඩල ප්‍රධානී සරත් දාෂ් ඇතුළු පාර්ශවකරුවන් සහ සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

මිනිස් වෙළඳාම නිරීක්ෂණය කිරීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම සඳහා ජාතික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ (2021 - 2025) අරමුණු වඩාත් ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා සහ රාජ්‍ය නොවන සහ සිවිල් සමාජ සංවිධාන සමඟ වඩාත් ක්‍රියාකාරීව සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා මිනිස් වෙළඳාමට එරෙහි ජාතික සංධානයේ (National anti-Human Trafficking Task force) මුලසුන දරන ආරක්ෂක අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මිනිස් වෙළඳාමට එරෙහි ජාතික සංධානය සඳහා නිල වෙබ් අඩවියක් (www.nahttf.gov.lk) පිහිටුවීමට මූලිකත්වය ගෙන ඇත. මෙම උත්සවයේදී එම වෙබ් අඩවිය නිල වශයෙන් එළිදක්වන ලදී

මිනිස් වෙළඳාම හා සම්බන්ධ සිද්ධීන් මැඩපැවත්වීමට සහය වීම සඳහා මෙන්ම ඒ පිළිබඳ සිද්ධීන් යොමු කිරීමට සහ මිනිස් වෙළඳාම නැමැති මෙම අපරාධය පිළිබඳ තොරතුරු ඕනෑම ඇමතුම්කරුවෙකුට ලබා දීමට සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයෙහි ක්ෂණික ඇමතුම් අංකයක් ක්‍රියාත්මක වේ. මෙම ක්ෂණික ඇමතුම් අංකය +94 766 588 688 සැමටම විවෘතය. වැඩි විස්තර සඳහා කරුණාකර ක්ෂණික දුරකථන අංකය අමතන්න නැතහොත් iomcolombo@iom.int යන විද්‍යුත් තැපැල භාවිතා කරන්න

***

වැඩි විස්තර සඳහා කරුණාකර සම්බන්ධ වන්නඃ

මිනෝලි පී. දොන්, ප්‍රධානි, ආරක්ෂක ඒකකය (Protection Unit), සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය, ශ්‍රී ලංකාව සහ මාලදිවයින - දුරකථනඃ (0094 777 409 409), විද්‍යුත් තැපැලඃ mdon@iom.int